ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கை சட்டத்தரணிகள் சங்கம்
**BAR ASSOCIATION OF SRI LANKA**

<u>**සිංහල පරිවර්තනය**</u>

2026/05/25

අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

<u>**අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ පද්ධතියේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීමට ඇති බව කියන පියවර සම්බන්ධයෙනි.**</u>

අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හඳුන්වා දීමට රජය සලකා බලමින් සිටින බවට මහජන අවකාශයේ පළ වී ඇති වාර්තා පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය (මින් ඉදිරියට මෙහි ශ්‍රී.ල.නී.ස. ලෙස සඳහන් කරනු ලැබේ) දැඩි අවධානය යොමු කර සිටී.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ සිට පිළිවෙළින් වසර 63 සහ 65 ලෙස පවතින අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව, අත්තනෝමතික ලෙස වෙනස් නොකළ යුතු බවත්, එවැනි වෙනසක් අවශ්‍ය හෝ යෝග්‍ය නොවන බවත් ශ්‍රී.ල.නී.ස. හි මතය වේ.

එසේ කිරීම, නීති පද්ධතියේ අඛණ්ඩතාව, නීතියේ ආධිපත්‍යය සහ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, රජය දක්වන කැපවීම කෙරෙහි මහජන විශ්වාසය අහිමි වීමට හේතු වනු ඇති අතර මෙම අරමුණ සඳහාම පමණක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒම පිළිබඳව රජයේ අභිප්‍රායන් මහජනතාව විසින් ප්‍රශ්න කිරීමට ඉඩ ඇත.

2020 ඔක්තෝබර් මස 29 වන දින සහතික කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව (අභියාචනාධිකරණයේ සභාපතිවරයාද ඇතුළුව) 12 සිට 20 දක්වාත්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව (අගවිනිසුරුවරයාද ඇතුළුව) 11 සිට 17 දක්වාත් වැඩි කර ඇති බව ඔබතුමා නිසැකවම දන්නා කරුණකි. එවැනි වැඩි කිරීමක් සිදු කර ඇති පසුබිමක, කාර්යමය වශයෙන් ද සලකන විට, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස ඉහළ නැංවීමේ සැබෑ අවශ්‍යතාවයක් පැවතිය නොහැක.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස සංශෝධනය කිරීම ව්‍යවස්ථා සංශෝධනයක් හරහා සිදු කළ යුතු බව ඔබතුමා දන්නා කරුණකි. වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විශේෂිත කාර්යයන් සඳහා (ad hoc) සංශෝධනයන්ට භාජනය වී ඇති අතර, ඇතැම් අවස්ථාවලදී බලයේ සිටින රජයේ දේශපාලන අවශ්‍යතා සපුරාලීම සඳහාත්, බොහෝවිට නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය සහ අධිකරණයට විරුද්ධවද එවැනි සංශෝධන සිදු වී ඇත.

President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

මේ අවස්ථාවේදී මෙම අධිකරණවල දැනට සේවයේ යෙදී සිටින විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස ඉහළ නැංවීම යනු අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කිරීමට දරන පැහැදිලි උත්සාහයක් ලෙස මහජනතාව විසින් සැලකීමට ඉඩ ඇත. දිගු කාලීන සැලසුමකින් තොරව එවැනි පියවරක් ඉදිරියට ගෙන යාම එම අධිකරණවල ගරු විනිසුරුවරුන්ගේ ගෞරවයටද හානි කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

තවද, වර්තමාන රජය එවැනි පියවරක් ඉදිරියට ගෙන යන්නේ නම් එය, අනාගත රජයන්ට ද අධිකරණමය කාර්යයන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දිගු කාලීන සැලසුමකින් තොරව සංශෝධන හඳුන්වා දීම පිළිබඳ භයානක පූර්වාදර්ශයක් වනු ඇත.

අධිකරණයේ ස්වාධීනත්වය සහ මහජනතාව ඒ කෙරෙහි තබා ඇති විශ්වාසය යනු නීතියේ ආධිපත්‍යයේ සහ අපගේ ජනරජයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවේ අත්‍යවශ්‍ය මූලස්ථම්භ වේ. ඒ සම්බන්ධයෙන්, අධිකරණය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ස්වාධීන බව පමණක් නොව, පූර්ණ වශයෙන් ස්වාධීන, අපක්ෂපාතී සහ ඉතාම සුළු වශයෙන් හෝ බලපෑම්, අනුග්‍රහයන්, හෝ නුසුදුසුකම් වලින් තොරව මහජනතාවට දැකගත හැකිවීම අතිශයින් වැදගත් වේ.

එබැවින්, නීතියේ ආධිපත්‍යය සහ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම පිළිබඳව තම යුතුකම ඉටු කිරීමේදී ශ්‍රී ලංකා නීතිඥ සංගමය, අධිකරණයේ හෝ ජනතාවගේ අවශ්‍යතා සඳහා නොවන, එවැනි යෝජිත සංශෝධනයක් සම්බන්ධයෙන් තම දැඩි අවධානය යොමු කර සිටින බව ගෞරවාන්විතව ප්‍රකාශ කර සිටී.

මෙම තත්ත්වයන් යටතේ, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ පද්ධතියේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස ඉහළ නැංවීම සඳහා යෝජිත කිසිදු ව්‍යවස්ථාමය සංශෝධනයක් සමඟ ඉදිරියට නොයන ලෙස නීතිඥ සංගමය ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටී.

ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන අධිකරණයේ ස්වාධීනත්වය, අඛණ්ඩතාවය, ගෞරවය සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව ඔබතුමා නිසි අවධානය දක්වනු ඇතැයි අපි විශ්වාස කරමු.

*අත්සන් කළේ*

*රජීව් අමරසූරිය*
*සභාපති*
*ශ්‍රී ලංකා නීතිඥ සංගමය*

*නලින් ද සිල්වා*
*ලේකම්*
*ශ්‍රී ලංකා නීතිඥ සංගමය*